# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය

The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

වාරය - II

ඒකකය - (12) බස ඉපදුණු සැටි අසනු ය විස්තර

ඉගෙනුම් පල :

- දේශන/සාකච්ඡාවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු උපුටා දක්වයි.
- දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු පිළිබඳ තම මතය ප්‍රකාශ කරයි.
- සබකෝලයෙන් තොර ව කතා කරයි.
- නිවැරදි ව හා පැහැදිලි ව කතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- උචිත පරිදි අංග චලන යොදා ගනිමින් කතා කරයි.
- සෙසු අයගේ අවධානය දිනා ගනිමින් කතා කරයි.

## (12) බස ඉපදුණු සැටි අසනු ය විස්තර

### පෙරවදන

''මෑත යුගයේ දී සිංහලයේ සම්භවය පිළිබඳව උගතුන්ගේ,- විශේෂයෙන් විදේශීය උගතුන්ගේ-, විමර්ශනාක්ෂිය යොමු වන්නට පටන් ගෙන ඇත්තේ එකුන්විසි වන සියවසේ මුල හරියේ සිට යි. ක්‍රි.ව. සිවුවන සියවස තරම් ඈත අතීතයේ පටන් ම දේශීය විද්වතුන් සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ විමර්ශනයන්හි යෙදුණු බවටත්, සිංහලය ඉන්දු-ආර්ය ගණයේ භාෂාවක් බව එබඳු බොහෝ විද්වතුන්ගේ පිළිගැනීම වූ බවටත්, මහාචාර්ය සෙනරත් පරණවිතාන ලක්දිව 'අන්තරාලීන ශිලාලිපි' මඟින් සාධක ඉදිරිපත් කොට තිබේ. කෝට්ටේ යුගය අවසාන වන තෙක් මෙරට පහළ වූ, -සිදත් සඟරා කතුවරයා ඇතුළු-, දේශීය පඬිවරුන් වැඩි දෙනා, ඇත්තකැයි විශ්වාස කළ බව සිතීමට හේතු සාධක ඇතත්, ඉන් පසු ඇති වූ භාෂා ශාස්ත්‍ර පරිහාණියත් සමඟ එම දැනුම ද කෙමෙන් අපවත් ව ගිය බවක් පෙනේ.''

**සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය - මහාචාර්ය විමල් ජී. බලගල්ලේ**

### අවබෝධය 01

**01. පාඨම හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් යනු කුමක් ද?

.............................................................................................................

2. මෙම බුද්ධි මණ්ඩල සාකච්ඡාවට සහභාගි වූ විද්වතුන් දෙපළ නම් කරන්න.

.............................................................................................................

.............................................................................................................

3. මෙම සාකච්ඡාව අන්තර්ගත ගුවන් විදුලි වැඩසටහන කුමක් ද?

.............................................................................................................

4. විචාරශීලීව සවන් දීම යනු කුමක් ද?

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

5. විද්වත් මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවන අයකු සතු විය යුතු ගුණාංගයක් ලියන්න.

.............................................................................................................

......................................................................................................................................

6. භාෂාව යනු කුමක් ද?

......................................................................................................................................

......................................................................................................................................

7. මානව සමාජය නිර්මාණය පිළිබඳ ආගමික විශ්වාසය පදනම් වූ මතවාදයක් ලියන්න.

......................................................................................................................................

......................................................................................................................................

8. ඒ පිළිබඳ පරිණාමවාදය පදනම් කර ගත් විද්‍යාත්මක මතවාදය ලියන්න.

......................................................................................................................................

9. ලෝකයේ පවතින ජීව භාෂා ප්‍රමාණය නිශ්චිතව ප්‍රකාශ කිරීමට නොහැකි වීමට හේතු දෙකක් ලියන්න.

......................................................................................................................................

......................................................................................................................................

10. මෙම බුද්ධි මණ්ඩල සාකච්ඡාව පැවැත්වීමේ අරමුණ කුමක් ද?

......................................................................................................................................

......................................................................................................................................

## අවබෝධය 02

**02. පහත දැක්වෙන ප්‍රකාශයන් හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.**

1. භාෂා ඥාතිත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේ උනන්දුව ලංකාවේ ඇති වූයේ ක්‍රි.ව. හතරවන සියවසේ දී ය. ☐
2. මූල භාෂා සංකල්පය බොහෝ ශිෂ්ට සමාජවල පහළ වුවක් නො වේ. ☐
3. මුල් ම භාෂාව පාලි හෙවත් මාගධී යන අදහස බුදුරජාණන් වහන්සේ වදාළ සේක. ☐
4. බුදුහාමුදුරුවෝත්, බ්‍රහ්මයෝත් කලින් කට හඬක් කනේ නො වැටුණු දරුවොත් කතා කරන්නේ මාගධී භාෂාව බව පටිසම්භිදා මග්ග අටුවාවේ දැක්වෙයි. ☐
5. විජය කුමාරයාට වංග භාෂාවත් මධුරා පුරෙන් ගෙනා කුමාරියට පාලි භාෂාවත් කතා කළ හැකි විය. ☐
6. ක්‍රි.පූ. හයවන සියවසේ දී මිසරයේ 'සාම්තිකස්' නම් රජතුමා මූල භාෂා පිළිබඳ පර්යේෂණයක් කළ බව 'හෙරඩෝටස්' පෙන්වා දෙයි. ☐
7. ලෝකයේ මුල් ම භාෂාව ''ෆ්‍රීජියන්'' බවට ඇතැම් පර්යේෂකයෝ විශ්වාස කරති. ☐

8. වානර මානව අවස්ථාව ඉක්මවා සැබෑ මානව අවස්ථාවට පත් වීමත් භාෂාවේ පහළ වීමත් එක ම අවධියක සිදු විය. [ ]

9. භාෂා උපභාෂා යනුවෙන් වර්ග දෙකකි. උප භාෂාවල ප්‍රාදේශික උප භාෂා දැකිය හැකි ය. [ ]

10. අද ලෝකයේ ජීව භාෂා හත් දහස් ගණනක් තිබෙන බව මේ විද්වතුන්ගේ අදහසයි. [ ]

11. මිනිසා සැබෑ මානව තත්ත්වයට පත් වූයේ මීට අවුරුදු දාහත් ලක්ෂ පණස් දහසකට පෙර බව නිර්ණය කොට තිබේ. [ ]

12. භාෂාව සංස්කෘතියේ වාහකයෙකි යන්න පිළිගත හැකි අදහසක් නොවේ. [ ]

13. භාෂාව කායිකව ලැබෙන දෙයක් නොව පරිසරයෙන් ලබා ගන්නා දෙයකි. [ ]

14. භාෂාවේ උපත හා භාෂාවක උපත යනුවෙන් පැහැදිලි කරන්නේ එක ම කරුණකි. [ ]

15. භාෂා ශක්‍යතාව, සන්නිවේදන ශක්‍යතාව යනු අදහස් ප්‍රකාශ කිරීම සඳහා ශබ්ද නිකුත් කිරීමේ හැකියාවයි. [ ]

**අභ්‍යාසය 1**

**03. ගැළපෙන පදය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(අධ්‍යයනය, ප්‍රයත්නයේ, නිශ්චිතව, නිර්ණය, විකාශනය,
සදාකාලිකව, විවරණය, ආවේණික, අවියෝජනීය, අනන්‍යතාව)

1. මහාචාර්යතුමා භාෂාව යනු කුමක් ද යන්න .............................................. කළේ ය.
2. මිනිසා .............................................. සංසාරයෙන් සංසාරයට ගමන් කරන්නෙක් හැටියට විශ්වාස කෙරේ.
3. මුලින් ම ක්ෂුද්‍ර ප්‍රාණීන් පහළ වී ක්‍රමයෙන් .............................................. වන බව විද්‍යාඥයා පෙන්වා දුන්නේ ය.
4. මානවයන්ගේ පාෂාණීභූත ඇට සැකිලි, ශීර්ෂ කලාපය ආශ්‍රය කර ගෙන කාල සීමා .............................................. කර ඇත.
5. තමාට ඒ සංඛ්‍යාව .............................................. ප්‍රකාශ කළ නොහැකි බව පර්යේෂකයා කීවේ ය.
6. භාෂා ඥාති සම්බන්ධතා පිළිබඳ .............................................. උගතුන් අතර කුහුල දනවූ කරුණකි.

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම :

7. භාෂාව කුමක් දැයි සෙවීමට ගත් ............................................ ප්‍රතිඵල අද දරුවන් විමර්ශනය කළ යුතු ය.

8. භාෂාව ලේ උරුමයෙන් ලැබෙන ............................................ දෙයක් නොවන බව වාග් විද්‍යාඥයෝ පෙන්වා දෙති.

9. භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ ............................................ සම්බන්ධතාවක් බව ගුරුතුමිය කීවා ය.

10. සංස්කෘතික උරුමයේ මුල සොයා යෑම අපේ ............................................ පැහැදිලි කොට ගැනීමට ඉවහල් වේ.

**ක්‍රියාකාරකම**

**04. නිවැරදිව යා කොට දක්වන්න.**

1. භාෂාණිභූත මිනිස් ඇටසැකිල්ලක් හමු වූ ස්ථානය
2. මාලදිවයිනේ කතා කරන භාෂාව
3. ස්වකීය භාෂාව පිතු බස (පීතෘ භාෂාව) ලෙස හඳුන්වන රට
4. දෙවියන් මුලින් ම කතා කළ භාෂාව ලෙස ඇතමුන් සලකන්නේ
5. කතා කිරීමේ හැකියාව අහිමි කළ කාන්තාවක් ඇසුරින් භාෂාව ගැන පර්යේෂණය කළේ
6. ග්‍රීක ජාතික ඉතිහාසඥයෙකි.
7. ''මාතා දමිළී පිතා අන්ධකො'' මෙහි අන්ධක යනු
8. මූල භාෂාව පිළිබඳ පර්යේෂණය කළ බව තොරතුරු දක්වෙන කෘතියකි.
9. සුළු ආසියාව යන ප්‍රදේශයේ ව්‍යවහාර වූ භාෂාවකි.
10. වෙනත් භාෂාවක් කන නො වැටී දරුවෙක් පළමුව පාලි භාෂාව කතා කරනවා යන අදහස දනවන යෙදුම

A - අස්සුතාලාප
B - ෆ්රිජියන්
C - හෙරඩෝටස්
D - පටිසම්භිදා මග්ග අටුවාව
E - ජර්මනිය
F - හිබ්රූ
G - ටැන්සානියාවේ ඔල්ඩුවායි
H - මිසරයේ සාමමිතිකස්
I - දිවෙහි බස
J - ආන්ද්‍ර දෙමළ

## අභ්‍යාසය 2

**05. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද පාඩමෙන් තෝරා ලියන්න.**

1. නොමනා - ..............................
2. අනවධානය - ..............................
3. ප්‍රත්‍යක්ෂ - ..............................
4. අනර්ථය - ..............................
5. අවිනිශ්චිත - ..............................
6. නොවෙනස් - ..............................
7. පරාධීන - ..............................
8. ම්ලේච්ඡ - ..............................
9. බිරිඳ - ..............................
10. පූර්ණ - ..............................
11. අජීවී - ..............................
12. භාවිත - ..............................
13. අතීතයේ - ..............................
14. විපත - ..............................
15. අවසානය - ..............................

**06. පාඩමෙහි එන පහත යෙදුම්වලට ගැළපෙන අර්ථ වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

1. විද්වතුන් - ..............................
2. පුනරුත්පත්තිය - ..............................
3. කල්ප විනාශය - ..............................
4. බ්‍රහ්ම ලෝකය - ..............................
5. ක්ෂුද්‍ර ප්‍රාණීන් - ..............................
6. පාෂාණීභූත - ..............................
7. ශක්‍යතාව - ..............................

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම :

8. සම්මුතියකට - ..............................................................................................
9. වාග් විද්‍යාඥයෝ - ..............................................................................................
10. ඥාතීත්වය - ..............................................................................................
11. ශතවර්ෂය - ..............................................................................................
12. අටුවාචාරීන් - ..............................................................................................
13. ඉතිහාසඥයෝ - ..............................................................................................
14. ගර්භණී - ..............................................................................................
15. බෙකොස් - ..............................................................................................
16. උපාර්ජනය - ..............................................................................................
17. කෘතඥතාව - ..............................................................................................
18. ප්‍රවිෂ්ට වීම - ..............................................................................................
19. වාහකයා - ..............................................................................................
20. වෘත්තාන්තයක් - ..............................................................................................

(අවුරුදු සියයක කාලය, කතාවක්, කළගුණ සැලකීම, ප්‍රවේශ වීම, නැදෑකම,
දරුගැබක් කුස හොත්, ඉතිහාසය පිළිබඳ හදාරන්නෝ, පාන්, වියත්හු, නැවැත ඉපදීම,
කුඩා ම ජීවීන්, ගල් ගැහුණු, රැගෙන යන්නා, හැකියාව, එකඟත්වයකට,
විශ්වයේ අවසානයේ සිදුවන විනාශය, ග්‍රහණය කර ගැනීම,
ත්‍රිපිටකයේ දුරවබෝධ පදවලට අර්ථකථන සැපයූ පුරාණ පැවිදි ඇඳුරන්,
දිව්‍ය තලයට එපිටින් ඇති ලෝකය, භාෂාව පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණවල යෙදෙන්නෝ)

# රාජකාරි හා ව්‍යාපාරික ලිපි ලිවීම

රාජකාරි කටයුතු සම්බන්ධයෙන් තොරතුරු සන්නිවේදනය කෙරෙන ලේඛන රාජකාරි ලිපි යනුවෙන් හැඳින්විය හැකි ය.

**01. (අ). පහත දැක්වෙන්නේ රාජකාරි ලිපියක අඩංගු විය යුතු කරුණු දැක් වූ සටහනකි. එය කියවා රාජකාරි ලිපියක ආකෘතියේ අනුපිළිවෙළ අනුව සකස් කිරීමට යෝග්‍ය වන සේ අංක යොදන්න.**

A. ස්තුති කිරීම (........)

B. යවන්නාගේ නම හා තනතුර (........)

C. සංක්ෂිප්ත මාතෘකාව (........)

D. ලබන්නාගේ ලිපිනය (........)

E. දිනය (........)

F. යවන්නාගේ ලිපිනය (........)

G. අපේක්ෂිත කාර්ය ඉටු කර ගැනීමට අවශ්‍ය තොරතුරු (........)

H. අත්සන හෝ අත්සන් තැබීමට වෙන් කළ ස්ථානය. (........)

**(ආ). ඉහත අනුපිළිවෙළ අනුව සකස් කළ අංග පහත ආකෘතිය තුළ ලියන්න.**



වෙළඳාම මූලික කර ගත් විවිධ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් තොරතුරු සන්නිවේදනය කරන ලේඛන ව්‍යාපාරික ලිපි ලෙස හැඳින්විය හැකි ය. ව්‍යාපාරික ලිපියක ආකෘතිය බොහෝ දුරට රාජකාරි ලිපියක ආකෘතිය හා සමාන වේ.

පුලස්ති බිම්සර පෙරේරා,
අංක 23,
පැඟිරිවත්ත පාර,
නුගේගොඩ.
2020.01.15

කළමනාකරු,
'ශක්ති' විදුලි නිෂ්පාදන සමාගම,
දෙහිවල පාර,
මහරගම.

**<u>කේ.ආර්. 225 දරණ මහන මැෂිමේ කාර්මික දෝෂ</u>**

2020.01.05 දින ඔබ ආයතනයෙන් මිලට ගත් කේ.ආර්. 225 දරණ මහන මැෂිමේ කාර්මික දෝෂ හට ගෙන ඇත.

මැෂිම පණගැන්වෙන විදුලි මෝටරය යම් යම් අවස්ථාවල දී ක්‍රියා විරහිත වීම, ඉතා ඉක්මනින් එම මෝටරය රත් වීම අපට දැන ගැනීම ඇති දෝෂ වේ.

ඉතා ඉක්මනින් ම මෙම මහන මැෂිමේ කාර්මික දෝෂ ඉවත් කොට දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටින්නෙමි.

ස්තුතියි,

මෙයට,

.........................
පුලස්ති බිම්සර
ගැනුම්කරු

**ක්‍රියාකාරකම 01**

**ඉහත ලිපියට ප්‍රතිචාර දක්වමින් අදාළ ආයතනයේ කළමනාකරු ගැනුම්කරු වෙත යවන ලිපිය සකස් කරන්න.**

**ක්‍රියාකාරකම 02**

**උතුරු ලුණුගම්වෙහෙර ග්‍රාම සංවර්ධන සංගමයේ ලේකම් වන ගුණදාස මහපොතාන, තම ප්‍රදේශයට විදුලි බලය ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ විදුලිබල අධිකාරිවරයා වෙත ලිපියක් ලිවීය. ඒ සඳහා ඔහු සකස් කර ගත් සටහන මෙසේ ය.**

- ගමේ පවුල් 100ක් පමණ විදුලිය අපේක්ෂා කරති.
- ගමට විදුලිය දුන හොත් වඩු කර්මාන්තය, ළමා ඇඳුම් මැහීම, ආහාර වර්ග සැකසීම ආදී ගෘහ කර්මාන්ත දියුණු කළ හැකි ය.
- රැකියා ප්‍රශ්නයට ද එය පිළිතුරක් වේ. රැකියා සඳහා නගරයට ඇදී යෑම වළකී.
- අධ්‍යාපන කටයුතුවලට ද එය පහසුවක් වෙයි.
- විදුලි රැහැන් ඇදීම කර ඇත්තේ අපේ ගමේ සීමාවට පමණි.

සංගමයේ ලේකම් ඔබ යැයි සිතා අදාළ ලිපිය ලියන්න.

# (12) බස ඉපදුණු සැටි අසනු ය විස්තර

## පිළිතුරු පත්‍රය

### අවබෝධය 01

**01.** 1. කිසියම් විෂය ක්ෂේත්‍රයක ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගේ සහභාගිත්වයෙන්, කිසියම් තේමාවක් පාදක කර ගෙන කරනු ලබන සාකච්ඡාවක්.
2. මහාචාර්ය විමල් ජී. බලගල්ලේ / මහාචාර්ය ජේ.බී. දිසානායක
3. හෙළ බස මහිමය
4. ඇසෙන දේ මනාව ග්‍රහණය කර ගනිමින් අවබෝධ කර ගනිමින් සවන් දීම.
5. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධය
6. මානව උරුමයක්/මානව නිෂ්පාදනයක්/අදහස ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක්
7. කල්ප විනාශයකින් පස්සේ ලෝකය පහළ වීම.
ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පැමිණි බ්‍රහ්මයන් පදිංචි වීම මඟින්
8. සෞරග්‍රහ මණ්ඩලයේ සාමාජිකයකු වන පොළොවේ පරිණාමය සැලකීමේ දී එක් අවධියක දී ක්ෂුද්‍ර ප්‍රාණීන් පහළ වන බව.
9. දේශපාලන සීමා/උපභාෂා තිබීම/එක් රටක භාෂා කිහිපයක් තිබීම.
10. භාෂාවේ සම්භවය පිළිබඳ තොරතුරු දැක්වීම.

### අවබෝධය 02

**02.**

| | | | | |
|---|---|---|---|---|
| 1. ✓ | 4. ✓ | 7. ✓ | 10. ✓ | 13. ✓ |
| 2. × | 5. × | 8. ✓ | 11. ✓ | 14. × |
| 3. × | 6. ✓ | 9. ✓ | 12. × | 15. ✓ |

### අභ්‍යාසය 1

**03.**

| | | | |
|---|---|---|---|
| 1. විවරණය | 4. නිර්ණය | 7. ප්‍රයත්නයේ | 10. අනන්‍යතාව |
| 2. සදාකාලිකව | 5. නිශ්චිතව | 8. ආවේණික | |
| 3. විකාශනය | 6. අධ්‍යයනය | 9. අවියෝජනීය | |

### ක්‍රියාකාරකම

**04.**

| | | | |
|---|---|---|---|
| 1. G | 4. F | 7. J | 10. A |
| 2. I | 5. H | 8. D | |
| 3. E | 6. C | 9. B | |

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම :

අභ්‍යාසය 2

**05.** 1. මනා
2. අවධානය
3. අනුමාන
4. අර්ථය
5. නිශ්චිත
6. වෙනස්
7. ස්වාධීන
8. ශිෂ්ට
9. භාර්යාව
10. අර්ධ
11. ජීවී
12. අවභාවිත
13. වර්තමානයේ
14. විපත
15. ආරම්භය

**06.** 1. වියත්හු
2. නැවැත ඉපැදීම
3. විශ්වයේ අවසානයේ සිදුවන විනාශය
4. දිව්‍ය තලයට එපිටින් ඇති ලෝකය
5. කුඩා ම ජීවීන්
6. ගල් ගැහුණු
7. හැකියාව
8. එකඟත්වයකට
9. භාෂාව පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණවල යෙදෙන්නෝ
10. නැදෑකම
11. අවුරුදු සියයක කාලය
12. ත්‍රිපිටකයේ දුරවබෝධ පදවලට අර්ථකථන සැපයූ පුරාණ පැවිදි ඇඳුරන්
13. ඉතිහාසය පිළිබඳ හදාරන්නෝ

14. දරුගැබක් කුස හොත්
15. පාන්
16. ග්‍රහණය කර ගැනීම
17. කළගුණ සැලකීම
18. ප්‍රවේශ වීම
19. රැගෙන යන්නා
20. කතාවක්